11 වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ ජීවත් වන ආදිවාසී ජනතාව පාරිසරික වෙනස්වීම්වලට අනුවර්තනය වන ආකාරය

ශ්‍රී ලංකාවේ ආදි ම ජන කොට්ඨාස අතුරින් අදත් අප අතර ජීවත් වන ජන කොට්ඨාසය වැදි ජනතාව යි. වැදි ජනතාවගෙන් අද ඉතිරි ව සිටින්නේ ඉතා සුළු පිරිසකි. වැදි ජනතාවගේ සම්භවය පිළිබඳ විවිධාකාර මත ඇත. ක්‍රි. පූර්ව 1500ට පමණ පූර්වයේ ශ්‍රී ලංකාවේ වාසය කළ 'බලංගොඩ මානවයාට' වැද්දන්ගේ සම්බන්ධයක් ඇතැයි ආචාර්ය ශිරාන් දැරණියගල මහතා ප්‍රකාශ කරයි. ඒ අනුව අපේ වැදි ජනතාවට දිගු ඉතිහාසයක් ඇති බව පෙනේ. දැනට ශ්‍රී ලංකාවේ ජීවත් වන වැදි වර්ග තුනක් හඳුනා ගෙන ඇත. ගල් වැද්දෝ, දඩ වැද්දෝ හෙවත් ගම් වැද්දෝ හා වෙරළබඩ වැද්දෝ හෙවත් මුහුදු වැද්දෝ යන නම්වලින් ඔවුහු හඳුන්වනු ලබති.

## ආදිවාසී ජනතාව ව්‍යාප්ත වූ ප්‍රදේශ

ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව පිළිබඳ කරන ලද පර්යේෂණ වාර්තාවලට අනුව දිවයිනෙහි තෙත් හා වියළි කලාපයෙහි ස්ථාන ගණනාවක වැදි ජනාවාස තිබූ බවට තොරතුරු සඳහන් වේ.

- ❑ උතුරු මැද පළාත - අනුරාධපුර දිස්ත්‍රික්කය - තන්තිරිමලේ, වන්නිහැලඹෑව, කටු කැලියාව, කිරිමැටියාව
  පොළොන්නරු දිස්ත්‍රික්කය - රොට වැව, පුස්දිවුල් වැව.
- ❑ ඌව පළාත - බදුලු දිස්ත්‍රික්කය - දඹාන, හෙන්නානිගල, වටවන කොට බකිනිය, සොරබොර, මුල්ලේගම, දානිගල, හේනෙබැද්ද, බිංගොඩ. මහියංගනය

ක්‍රියාකාරකම 1


- ◆ ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ ව්‍යාප්ති ප්‍රදේශ දැක්වෙන සිතියමක් පිළියෙල කරන්න.

- ❑ නැගෙනහිර පළාත - මහ ඔය, නුවරගල, සිතල වන්නිය, ඇඹිලින්න, ඇත්බැද්දගල, පොල්ලෙ බැද්ද.

## පරිසරයට අනුවර්තනය වීම

ආදිවාසී ජනතාව ජීවත් වූයේ වනගත ප්‍රදේශවල ය. ඒ නිසා ඔවුහු එම පරිසරයට අනුවර්තනය වෙමින් ජීවිකාව ගෙන ගියහ. මුල් අවදියේ ඔවුන්ගේ නිවාස වූයේ ගල් ලෙන් ය. ඇඳුම යන්තම් ඉන ප්‍රදේශය ආවරණය වීමට පමණක් ප්‍රමාණවත් විය. දඩයමින් ආහාර සොයා ගැනීමට පුරුදු ව සිටි නිසා දුනු, ඊතල, පොරොව, කෙටේරිය, පිහිය ඔවුන්ගේ ප්‍රධාන ආයුධ ලෙස භාවිත කළහ. ඉනෙහි නිතර රඳවා ගෙන සිටි පොරොව ගස් බෙනවල මී කැඩීමට භාවිත කළහ. රුස්ස ගස්වල බෙනවල මී පැණි පුරවා සතුන්ගේ මස් ඒවායේ තැන්පත් කොට මැටිවලින් වසා ටික කලක් තබා ආහාරයට ගැනීමට ඔවුන් පුරුදු වී ඇත. සරල ජීවිතයක් ගත කරන අතර භාණ්ඩ ස්වල්ප වශයෙන් පරිහරණය කරන ලදි. වනයට ආදරය කළ අතර, සතා සිවුපාවුන්ට ද අනවශ්‍ය ලෙස හානි පැමිණ වූයේ නැත. ඔවුන් කළේ ආහාරය සඳහා සතුන් දඩයම් කිරීම පමණකි. මී පැණි රැස් කිරීමට විශේෂ ලෙන්ගතු කමක් දක්වති. දරු උපත් සිදු වූයේ ගල් ගුහාවක, පැලක හෝ, වනයේ ගසක් අසල ය. මළවුන් ඇදහීම ඔවුන්ගේ විශ්වාස අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී. තම සමාජ කණ්ඩායමේ පැවතුම් රටාවන් නො බිඳී පවත්වා ගෙන යාමට දැඩි කැමැත්තක් දක්වති. කුඩා කණ්ඩායම් ලෙස ජීවත් වන මොවුන් රෝගී වූ විට බෙහෙත් සපයා ගත්තේ අවට පරිසරයෙනි. ගස්වල කොළ, පොතු, අල, මුල් ආදිය මෙන් ම පිඹුරු තෙල් වැනි සතුන්ගේ තෙල් වර්ග ද ඖෂධ ලෙස භාවිත කළහ.

කාලයත් සමග පැරණි වැදි සමාජයෙහි යම් යම් වෙනස්කම් සිදු විය. ගල්ලෙන් අත හැර නිවාස තනා ගැනීමට පුරුදු වූ අතර ඒ සඳහා අවශ්‍ය දෑ තමා ජීවත් වූ වනයෙන් ම ලබා ගත්හ. එපමණක් නොව ඔවුන්ගේ පැරණි සංස්කෘතික ලක්ෂණයන් හි ද පරිවර්තනයක් සිදු වන්නට පටන් ගත්තේ ය.



11.1 රූපය
ආදිවාසීන්ගේ ගල්ලෙනක



11.2 රූපය
පොල්ලේ බැද්දේ හිටපු වැදිනායක
පොරමල් සකා

## පැරණි ජීවන රටාවෙන් වෙනස් වීමට බලපෑ හේතු

1. සංවර්ධන යෝජනා ක්‍රමවල ව්‍යාප්තිය

   මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව කන්දෙගම්වෙල, කෙරගොඩ, කොටයාය ආදී ගම් මාදුරු ඔය ජාතික වනෝද්‍යානයට අයත් වීම නිසා ඒ ගම් අත හැර අලුත් ජනපදවල පදිංචියට යන ලදී. ගල්ඔය ව්‍යාපාරය නිසා ඉගිනියාගල ප්‍රදේශයේ සිටි වැද්දන් සිංහල ගම්මානවල ජනතාව සමග ඇසුරු කිරීම නිසා සංස්කෘතික වෙනස්කම්වලට භාජනය වීම.
2. වත්මන් වැදි පරපුරේ දරුවන් පැරණි ජීවන ක්‍රමය වෙනස් කිරීමට කැමැත්තක් දැක්වීම.
3. දේශීය හා විදේශීය සංචාරකයින් සමග නිතර නිතර සම්බන්ධතා පැවැත්වීමට සිදු වීම.
4. සිංහල හා දෙමළ ජනතාව, වැදි ජනතාව සිටින ප්‍රදේශ අසල පදිංචි වී සිටින නිසාත් ඔවුන්ගේ ගති පැවතුම්වල ආභාසයන් ලැබීම.
5. විවිධ සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීමේ දී වනගහනය අඩු වීම.
6. වැදි දරුවන් විධිමත් අධ්‍යාපනයට යොමු වීම.

ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ට ද සංවර්ධන ව්‍යාපාර මත සිදු වූ සමාජ ආර්ථික වෙනස්කම්වල බලපෑම්වලට ගොදුරු වීමට සිදු වී ඇත. ඒ නිසා ඔවුන්ගේ ඉපැරණි සමාජ චාරිත්‍ර, ගතිසිරිත්, ක්‍රමයෙන් වෙනස් වී සම්මිශ්‍රණයක් ඇති වී තිබෙන බව පෙනේ.

ඔවුන් සිංහල හා දෙමළ ජන කොට්ඨාස සමග ආවාහ විවාහ සම්බන්ධතා පැවැත්වීම ආරම්භ කර ඇත. ඔවුහු ගල්ගුහාවල පදිංචිය අතහැර කටුමැටියෙන් තැනූ ගෙවල ස්ථිර පදිංචියට පුරුදු වී සිටිති. දඩයමෙන් ආහාර සපයා ගැනීම සීමා වී ඇත. වන සතුන් වඳවී යාම හා සංවර්ධන ව්‍යාපාර නිසා යම් යම් නීතිමය බලපෑම් ඇති වීම ඊට හේතු විය. ආදිවාසීන්ගේ වාසස්ථානය වූ වනයේ ප්‍රමාණය කුඩාවත් ම ඔවුන්ගේ බල ප්‍රදේශය සීමා වීම නිසා රිසි සේ තම අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීමෙන් ඇති වන අඩුව සපුරා ගැනීමට නගරයට පැමිණෙන්නට පුරුදු වූහ. නිදසුන් වශයෙන් මහියංගනය වැනි නගරවලට පැමිණ ඇඳුම්පැළඳුම්, ලුණු හා මිරිස් ආදිය ලබා ගැනීමට පුරුදු වූහ. සංචාරකයින් නිසා ආදිවාසීන්ගේ චර්යාමය වෙනස්කම් සිදු වී ඇත.

කලක් ආහාර රැස් කරන්නෙකු වශයෙන් ජීවත් වූ ආදිවාසීන් දැන් ආහාර නිෂ්පාදනය කරන්නෙකු බවට පත් වී ඇත. ඔවුන් හේන් ගොවිතැනට පුරුදු වීම ඊට නිදසුන් ලෙස දැක්විය හැකි ය. එහෙත් එය ද සාර්ථක ජීවන ක්‍රමයක් බවට පත් කර ගැනීමට ඇති බාධා බොහෝ ය. ආදිවාසීන්ගේ සමාජවල වත්මන් පරපුර නවීකරණයන් වැළඳ ගැනීමට දක්වන කැමැත්ත වැඩි වීම නිසා ඔවුන්ගේ වැඩිහිටියන් හා තරුණ පරම්පරාව අතර අදහස්වල ගැටීම් හට ගෙන ඇත. ඇතැම් තරුණ පිරිස් ඔවුන්ගේ පැරණි ගතිසිරිත්, සම්ප්‍රදායන් අත හැර දමා නවීකරණය වූ සමාජය ආදරයෙන් වැළඳ ගැනීමට වැඩි කැමැත්තක් දක්වති. ඒ නිසා ඔවුන් අධ්‍යාපනය ලබමින් විවිධ රැකියා කිරීමට පෙළඹී ඇත.

## අභියෝග

- ආදිවාසීන්ගේ ඉපැරණි සිරිත් විරිත් රැක ගනිමින් ඔවුන්ට ආවේණික වූ ජීවන රටාව තව දුරටත් පවත්වා ගෙන යාමට ඇති බාධාවන්.
  උදා:- සංවර්ධන ව්‍යාපාර හා සැලැසුම් නිසා ඔවුන්ට රිසි සේ හැසිරීමට ජීවත් වීමට සුදුසු වනගත පෙදෙස් නොමැති වීම.
- ආදිවාසීන්ගේ පරම්පරාවේ අය සිංහල හා දෙමළ ජනතාව සමග ආවාහ විවාහ ආදියෙන් සම්බන්ධ වීම නිසා කුලසිරිත් විරිත් පවා වෙනස් වීම.
- ආදිවාසීන්ගේ වත්මන් තරුණ පරපුරේ බොහෝ දෙනා වෙනස් වන නවීන සමාජයට අවතීර්ණ වීමට ඇති කැමැත්ත.
- ආදිවාසීන්ගේ සමාජයේ වැඩිහිටියන් හා තරුණ පරපුර අතර ඇති අදහස් හා සිතුම් පැතුම්වල අසමානතාව.

මෙවැනි අභියෝගවලට මුහුණ පෑමට සිදු වීම නිසා අනාගතයේ දී ආදිවාසී ජන සමාජයේ ගතිලක්ෂණ හා පැවතුම් රටාවන් කෞතුකාගාරයකින් අධ්‍යයනය කළ යුතු තත්ත්වයකට පත් වීමට ඇති ඉඩකඩ බොහෝ ය.

ක්‍රියාකාරකම 2

- ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ඔවුන් ජීවත් වන පරිසරයට දැඩි ඇල්මක් දැක් වූ බවට දැක්විය හැකි සාධක නිදසුන් සහිත ව රැස් කරන්න.
- පරිසර සංරක්ෂණය සඳහා ආදිවාසීන්ගෙන් අපට ලබා ගත හැකි ආදර්ශ කවරේ ද?
- ශ්‍රී ලංකාවේ ආදිවාසීන් සෙසු ජනතාව සමග සම්බන්ධ වන අවස්ථා මොනවා ද?



11.3 රූපය
වැදි ජනතාවගේ ආගමික නර්තනයක්



11.4 රූපය
වැදි ජනතාවගේ ප්‍රියතම ආහාරයක් වන
මී පැණි සහිත මී වද